2023 මැයි

7

# ප්‍රීතිමත් වැඩිහිටියන් සඳහා පුවත් පත්‍රිකාව

## දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය

### -වැඩිහිටියන් සඳහා නිවාස-



## පසුබිම

ශ්‍රී ලංකාව වැඩිහිටි රැකවරණය උත්තරීතර මානව ගුණාංගයක් ලෙස සලකන සහ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ජාතියකි. ලෝකයම නාගරික කරණය වෙමින් පවතින යුගයක වැඩිහිටියන්ගේ භූමිකාවේ පැවැත්ම අභියෝගයට ලක්වී ඇත. නිවසේ සිටින වැඩිහිටියන්ගේ කායික හා මානසික අවශ්‍යතා නොසලකන තරමටම න්‍යෂ්ඨික පවුල වෙනස් වී ඇත.

එවැනි තත්වයක් තුළ වැඩිහිටියන්ට ගරු කරමින් ඔවුන්ට සැළකිල්ල දක්වමින් වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය සඳහා මැදිහත් වී ප්‍රවර්ධනය කිරීමට රජය පියවර ගෙන තිබේ. එබැවින් ශ්‍රී ලංකා රජය විසින් 1991 දෙසැම්බර් 16 වන දින වැඩිහිටි පුද්ගලයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්ති ( විභේදන අංක 46/91) පිළිගෙන අනුමත කර ඇත. වැඩිහිටියන්ට අවශ්‍ය අනුග්‍රාහක ජීවිතය ලබාදිය යුතු බව රජය තීරණය කොට ඇත.

## යෝජනාක්‍රමයේ අන්තර්ගතය සහ ප්‍රමුඛතාවය





- මෙම යෝජනා ක්‍රමය යටතේ නව නිවසක් ඉදිකිරීමට හෝ පවතින නිවස ප්‍රතිසංස්කරණය කොට සංවර්ධනය කිරීම සඳහා සමාජ ආරක්ෂණ අරමුදලින් මූල්‍ය ආධාර ලබා දේ (රු 70,000).
- අරමුදල් මත පදනම්ව සෑම වසරකම ප්‍රතිලාභීන් 50 ක් තෝරාගනු ලබන අතර සෑම දිස්ත්‍රික්කයකින්ම දෙදෙනෙක් බැගින් තෝරාගනු ලබයි.

**ප්‍රතිලාභීන්ගෙ ප්‍රමුඛතාවය**

- අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන්
- මාසික ආදායම රු 6000 ක් හෝ ඊට වඩා අඩු අදායම් සහිත අය
- ආබාධ සහිත පුද්ගලයින්
- වැන්දඹු බව
- තනි දෙමව්පියන්
- තනිව ජීවත්වන්නන්

## තෝරාගැනීමේ ක්‍රමවේදය

පියවර 1

1) ජාතික වැඩිහිටි මහලේකම් කායාීලය මගින් තෝරා ගැනීමේ නිර්ණායක ප්‍රාදේශීය ලේකම් කායාීලය වෙත යොමු කරයි.

පියවර 2

2) වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරී හෝ සමාජ සේවා නිලධාරී විසින් ඉල්ලීම සහතික කර නිර්දේශ සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යවනු ලැබේ.

පියවර 3 අප්‍රේල් වනවිට

3) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අප්‍රේල් මස අවසන් වන විට වැඩිහිටියන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයට තෝරාගත් ඉල්ලීම් තුනක් ඉදිරිපත් කරයි.

පියවර 4

4) මෙම ඉල්ලීම් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාල මගින් පරීක්ෂා කර අදාළ මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මුදා හරිනු ලැබේ.

පියවර 5 නොවැම්බර් වනවිට

5) දෙසැම්බර් 30 වන විට ඉදිකිරීම් අවසන් කළ යුතුය. ඉදිකිරීම් ආරම්භයේ සිට අවසානය දක්වා වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරියා හෝ සමාජ සේවා නිලධාරියා විසින් සම්පූර්ණයෙන් අධීක්ෂණය කළ යුතුය.

## ✔ යහපත් ක්‍රියා හඳුනා ගැනීම

### 1. නිවාස අවශ්‍ය අය හඳුනා ගැනීම



මෙම සීමිත අරමුදල් සැබැවින්ම අරමුදල් අවශ්‍ය අය හට පමනක් ලැබීම තහවුරු කිරීම සඳහා මෙම පියවර අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත් මෙය පහසු විසඳුමක් නොවන අතර පහත සඳහන් කරුණු සළකා බැලිය යුතුය:

- රජයේ අයවැය සීමාවන්, ආදායම ඉහළ නැංවීමට රජයට ඇති හැකියාව පිළිබිඹු කරයි.
- දිරිගැන්වීමේ බලපෑම්, දුප්පතුන් සඳහා ලබා දෙන ආධාර ලබා ගැනීම සඳහා දුප්පතුන් නොවන අය තම හැසිරීම වෙනස් කරගැනීම.
- දේශපාලනික ආර්ථිකය, මෙය පැන නගින්නේ දුප්පත් නොවන මිනිසුන් දුප්පත් මිනිසුන්හට උදව් කිරීමට සහාය නොදක්වන විටයි.



### 2. සම්බන්ධතාමය ජීවිතයේ ප්‍රවර්ධනය

පුද්ගලයින් තුළ සමාජීය අන්‍යෝන්‍ය සබඳතා පවත්වා ගැනීම සඳහා ඇති උනන්දුව නිවාස වැඩසටහන මගින් පිළිබිඹු වේ. මෙවැනි සබඳතා වර්ථමාන සහචරයන් සමඟ හෝ පුළුල් ප්‍රජාවක් තුළ සිදුවේ. මෙවැනි සම්බන්ධතා ප්‍රවර්ධනය ස්වාධීනව ජීවත් වීමට වඩා යහපැවත්ම තහවුරු කරගැනීම සඳහා ප්‍රධාන සාධකයක් වේ.



සමාජීය අන්තර් ක්‍රියා සහ සම්බන්ධතා වල වැදගත්කම හඳුනා නොගෙන සමාජ බැඳීම් සහ ප්‍රජාව පිළිබඳව හැඟීමක් දිගටම පවත්වා ගැනීමට ඇති අවස්ථා අඩුය. නිවැසියන් ඉදිරිපත් කරන ආකාරයට සමාජීය හුදෙකලාව නැතිකිරීම සඳහා වැඩි ප්‍රවණතාවයක් ඇති කිරීමට නිවාස වැඩසටහන හේතුවිය හැක.

වැඩිහිටි පුද්ගලයින් තමන්ගේම නිවසේ දන්නාකියන අසල්වැසියන් සහ ප්‍රජාව සමඟ සිටීමේ වාසි ඇත. ඔවුන්ගේ ජීවිත පහසු හා ආරක්ෂා සහිත කිරීම සඳහා නිවෙස් අලුත්වැඩියාව සහ නවීකරණය කිරීම කළ හැකිය.



## ක්ෂේත්‍රයෙන් පණිවිඩ



යමෙක් සමෘද්ධිමත් රටක් දුටුවහොත් එහි උරුමක්කාරයන් වන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ය. ඉඩම් සරු කිරීමට දායකවූ ඔවුන්ගේ කායික මානසික ශ්‍රමය නිසා අපි ඔවුන්ට සදා ණය ගැති වන්නෙමු. දිරිය පියස යනු එවැනි පිරිසකට සෙවණ ලබා දීම සඳහා ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මගින් හඳුන්වාදෙනු ලැබූ වැඩසටහනකි. මේ වන විට ලංකාව පුරා නිවාස 50 ක් සංවර්ධනය කර ඇත. එක් නිවසකට රුපියල් ලක්ෂ 7 ක් බැගින් වියදම් වී ඇත. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩසටහන් අතරින් දිරිය පියස පෙරමුණ ගෙන ඇති බව පැහැදිලිය.

වැඩිහිටියන්ට තමන්ගේම නිවසක් උරුම කරදීමේ අරමුණින් ඔවුන් අවසන් හුස්ම හෙළන තුරු ඔවුන්ගේ සිහින සැබෑකර දීමට දිරිය පියසට ඉදිරි වසර කිහිපය තුළ දැවැන්ත සාර්ථකත්වයක් අත්කර ගැනීමට හැකිවනු නොඅනුමානය.

**M. දිලානි කුමාරි (වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කෑගල්ල)**

ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන සුභසාධක වැඩසටහන් අතර දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය තවත් ප්‍රධාන වැඩසටහනකි. මෙම වැඩසටහන මගින් අඩු අදායම් ලාභී නිවාස නොමැති වැඩිහිටි පුරවැසියන්ට සහනයක් සැළසේ.

මිනිසාගේ මූලික අවශ්‍යතා අතර ආහාර, ඇඳුම් පැළඳුම් සහ නිවාස ප්‍රමුඛ තැනක් ගනී. එබැවින් මෙම වැඩසටහන මගින් වයස අවුරුදු 60 ට වැඩි අඩු ආදායම් ලාභී නිවාස නොමැති අය හඳුනා ගනී. වැඩිහිටි පුරවැසියෙකුට නිවසක් ලබාදීමෙන් අප කළ සේවයේ ප්‍රායෝගික අත්දැකීම් තුළින් විශාල ආත්ම තෘප්තියක් ලබා ගැනීමට හැකිවී තිබෙනවා. විශේෂයෙන් මහළු අයට සතුටින් සිටීමට උපකාර කිරීම මහත් පිනකි.



දිරිය පියස වැඩසටහන මගින් පසුගිය වසරේ සෑම දිස්ත්‍රික්කයකම ප්‍රතිලාභීන් දෙදෙනෙකු සඳහා ඉතා වටිනා වැඩසටහන් මෙන්ම ප්‍රතිපාදනද ලබා දී ඇත. පසුගිය වසරේ එක් අයකුට ලබාදුන් උපරිම ලක්ෂ 5 ක මුදල මේ වසරේ ලක්ෂ 7 ක් දක්වා වැඩිකිරීම ඉතා වැදගත්ය.

අද පවතින දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දරිද්‍රතාවයෙන් පෙළෙන වැඩිහිටියන් වෙනුවෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සිදු කරන මෙහෙවරට මාගේ කෘතඥතාවය පුද කර සිටිමි.

**S. R. P. චමිලා උදයාංගනී (වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතර)**

## නැවත ඉදිකිරීම සඳහා උදාහරණ



➔



## ප්‍රතිලාභීන්ගේ පණිවුඩ



මමයි මගේ බිරිඳයි ජීවත් උනේ ලී නිවසක අපිට ස්ථිර නිවසක් තිබුනෙ නෑ. මගේ දරුවත් ඉන්නෙ අසනීපෙන්. ඉතින් ගිය අවුරුද්දෙ ජාතික වැඩිහිටි මහලේකම් තුමා අපිට ගෙදර හදල දුන්නා. කාර්‍යාලය මගින් ලක්ෂ 5 ක මුදලක් දුන්නා. ඒ සල්ලි වලින් ස්ථිර නිවසක් අපිට හදාගන්න පුලුවන් උනා. මේ වන විට මගේ බිරිඳත් නැතිවෙලා. මම මගේ දරුවත් එක්ක මේ ගෙදර ජීවත් වෙනවා. මම ගොඩක් අසරණයි. මෙවැනි උදව් වැඩිහිටියන්ට ඉතාම වටිනවා.

**M. U. D.පියදාස,රන්විජයගම, උඩපොල, දැරණියගල**



**සතුට සහ ස්තූතිය-- කවියක්**

ගෙයක් දීමේ සතුට අපේය
අපේ හදවත් තුළ සුවඳ මල් පිපෙයි
ගෞරවනීය නිළධාරීන් සහ මහත්වරුනි අප සැමට
අපගේ ආදරය සහ ගෞරවය සමඟ
ලක්ෂ පහක ප්‍රතිපාදන දුන්නා
ඉදිකළ නිවස සුපිරි නිවසකි
ලබාදුන් ආධාර ගැන කීමට
අපි සියළු දෙනාම ස්තූති මල් පුදන්නෙමු
**විජිත් දිසානායක, දෙයියන්දර, මුල්ලතියාන.**



අපේ රටේ ආර්ථික සමාජීය, සංස්කෘතික සාරධර්ම පෝෂණය කළ වැඩිහිටියන්ට කළ යුතු සැළකිල්ල මැනිය නොහැකිය. අපි සැම විටම වැඩිහිටියන්ගේ මඟපෙන්වීම යටතේ හැදී වැඩුනෙමු. එවන් සංස්තියකට උරුමකම් කියන ජාතියක් ලෙස ඔවුන්ට වැඩිහිටි වියේදී ස්වාධීනත්වය, අභිමානය සහ ආත්ම අභිමානය ඇත.

ගෞරවාන්විතව ජීවත් වීමට පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් වැඩිහිටි සුභසාධන ජාතික අරමුදලින් ලැබෙන මූල්‍යමය දායකත්වය යටතේ දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කෙරේ. මෙම ව්‍යාපෘතිය මගින්, වැඩිහිටියන්ද සමාජය තුළ වලංගු බව තහවුරු කරමින් සහ ඒ සඳහා ඔවුන්ගේ මානසික හා කායික සෞඛ්‍ය පසුබිම සකසනු ලබයි.

**රවීන්ද්‍ර සුනිමල් ගුනතිස්ස,**
**වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරී, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**

**කරුණාකර ඔබේ ප්‍රජාව තුළ සිදු වන යහපත් ක්‍රියාකාරකම්**
**jica.procees@gmail.com වෙත යවන්න**

තරුණ, වැඩිහිටි සහ ආබාධිත අධ්‍යක්ෂක මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත සහ COVID ප්‍රතිචාර රාජ්‍ය අමාත්‍යාංශය
ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ප්‍රජාව තුළ වැඩිහිටි සේවයේ ධාරිතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

**ව්‍යාපෘති කාර්යාලය**
**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය (NSE),**
**ලිපිනය: D බ්ලොක්, 2 වන මහල, සෙත්සිරිපාය අදියර (II), බත්තරමුල්ල, කොළඹ**
**විද්‍යුත් තැපැල: jica.procees@gmail.com**

Ministry of Health